ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

<u>ඩෙංගු මර්දන ප්‍රයත්නයන්ට සහයෝගයක් වශයෙන් ඉන්දියාව ටෙක්නිකල් මැලතියන් ලීටර් **500**ක් පරිත්‍යාග කරයි</u>

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා අද දින ශ්‍රී ලංකාවේ ඩෙංගු ව්‍යාප්තිය පාලනය කිරීමේ ප්‍රයත්නයන්ට සහයෝගයක් ලෙස ටෙක්නිකල් මැලතියන් ලීටර් 500ක් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා වෙත භාර දුන්නේය.

2. මෙම මැලතියන් තොගය ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි ඉන්දිය රජයේ සහ ජනතාවගේ පරිත්‍යාගයක් ලෙස ශ්‍රී ලංකා රජයට සහ ජනතාවට ලබා දෙන ලදී. මෙම තොගය UPL ලිමිටඩ් යන ඉන්දියානු සමාගම විසින් සැපයූ අතර ශ්‍රී ලංකා රජය ඉල්ලීම සිදු කර සති දෙකක් වැනි කෙටි කාලයක් තුළදී කොළඹට රැගෙන එන ලදී. අර්බුදයකදී පළමු ප්‍රතිචාරකයා ලෙස ඉන්දියාවේ භූමිකාව මෙමගින් යළිත් වරක් ඉස්මතු විය.

3. 2026 වසරේදී ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන් 86,000ක් පමණ වාර්තා වී ඇති අතර බස්නාහිර පළාත වැඩිම බලපෑමකට ලක්ව ඇති පළාත් අතර වේ. ඩෙංගු ව්‍යාප්තිය පාලනය සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් විසින් සිදු කරනු ලබන විශාල පරිමාණයේ ධූමායන කටයුතු සඳහා මෙම මැලතියන් තොගය යොදා ගැනෙනු ඇත.

4. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන් සහ අවශ්‍යතාවයන් අනුව ශ්‍රී ලංකාවට සහය වීම සඳහා ඉන්දියාවේ කැපවීම අවධාරණය කළේය. එසේම එතුමා මෙම තොගය සැපයීම සඳහා පහසුකම් සපයමින් ලබා දුන් සහයෝගය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා බලධාරීන්ට ස්තුතිය පිරිනැමුවේය.

5. මෙම මුලපිරීම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සමීප, ජනතා කේන්ද්‍රීය හවුල්කාරිත්වය සම්බන්ධයෙන් තවත් නිදසුනක් වන අතර එමගින් අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය උදෙසා ඉන්දියාවේ අචල කැපවීම පිලිබිඹු කරයි.

***

කොළඹ
*2026 අගෝස්තු 04*